# හඬ




CED Sri Lanka

Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව කලාපය 2026 මැයි




# උද්දේශනය යනු කුමක්ද?

**පුංචි ක්‍රියාවක් සමාජයක් වෙනස් කරයි.**

සමාජයක් වෙනුවෙන් ඔබට කිසියම් හෝ දෙයක් සිදු කිරීමට ඇත්නම් එය කොතරම් අගනේ ද. මේ ඔබ නොදන්න ඔබේ හඬින් සමාජයට මෙහෙවරක් සිදු කිරීමට ඇති හොදම අවස්ථාවකි. ඔබ උද්දේශනය පිළිබඳ ඇති අවබෝධය කුමක්ද අද අපි උද්දේශනය පිළිබඳ කරුණු සොයමු.

උද්දේශනය යනු සරලව කිසියම් අයිතියක්, අරමුණක්, අයිතිවාසිකමක් වෙනුවෙන් පෙනී සිටීම හෝ හඬක් නැගීමයි. සමාජයේ කිසියම් හේතුවක්, අදහසක් හෝ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කතා කිරීම, සහය දීම සහ ක්‍රියා කිරීමයි. සරලව කිවහොත්, උද්දේශනය කියන්නේ හරි දේකට පක්ෂව පෙනී සිටීම සහ සමාජයේ යහපත් වෙනසක් ඇති කිරීමට උත්සාහ කිරීමයි.

**උද්දේශනයේ ඉතිහාසය**

උද්දේශනය යන වචනය ලතින් භාෂාවෙන් advocare යන වචනයෙන් බිදී ආ පදයකි. එහි අරුත වන්නේ කෙනෙකු ආධාරයට කැදවීම යන්නයි. පුරාණ රෝමයේ නීති කටයුතු වලදී පුරවැසියෙකු වෙනුවෙන් කතා කිරීමට නඩු අවස්ථා වලදී ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කතා කිරීමට හා ආරක්ෂා කිරීමට කැදවනු ලබන අයෙකි.මෙයින් බිදී හා වචනයක් උද්දේශනය වේ.

**උද්දේශනය පිළිබඳ නිර්වචන**

Systematic and purposeful action by a social worker to defend or advance

3 වන පිටුවට

## ඇතුළත

| | |
|---|---|
| ශ්‍රී ලංකාව පිළිබද මූලික දත්ත හා රජයේ පාසල් පිළිබද මූලික තොරතුරු | 2 |
| හඬක් නැගූ දිරිය කත -මලාලා යුසුෆ් | 4 |
| සිවිල් සමාජ උද්දේශන ක්‍රම | 5 |
| අධ්‍යාපන සාමාන්‍ය දැනීම | 5 |
| Youth-Led Protests and Policy Change: from Sri Lanka & Southeast Asian region | 6 |
| විවිධ පාසල් සංකල්ප | 9 |
| ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 10 |
| අධ්‍යාපන ප්‍රතිපත්ති හා ප්‍රතිඵල මූලික කළමනාකරණය පිළිබද 6 වන වැඩමුළුව - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග | 10 |

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**අපගේ අරමුණු**

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරිම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

## ශ්‍රී ලංකාව පිළිබඳ මූලික දත්ත හා රජයේ පාසල් පිළිබඳ මූලික තොරතුරු

| Country fact and Figures | |
|---|---|
| Mid-year population ('000) (2025) | 21,756 |
| Population density (2025) | 349 persons per sq.km. |
| Gini coefficient of household income (2019) | 0.46 |
| HDI (Value/Rank) 2023: Rank among 193 countries | 0.776 – 89 |
| Literacy Rate (2024) (d) Average | 93.3% |
| • Male | 94.0% |
| • Female | 92.6% |
| University Education Student/ teacher ratio (2025) | 26.3% |
| General Education Student/ teacher ratio (2025) | 15.5% |

Sources: Annual Central Bank Report 2025

| Basic Statistic of the Government School - 2025 | |
|---|---|
| All Government Schools | 10,047 |
| • National Schools | 396 |
| • Provincial Schools | 9651 |
| All Students | 3,747,544 |
| • Male Students | 1,856,100 |
| • Female Students | 1,891,444 |
| • National Schools | 825,644 |
| • Provincial Schools | 2,921,900 |
| All Teaching Staff | 242,309 |
| • Male Teaching Staff | 55,413 |
| • Female Teaching Staff | 186,896 |
| Principals (Included SLEAS and SLPS Principals only) | 12,648 |
| All Teachers | 229,661 |
| • Male Teachers | 48,686 |
| • Female Teachers | 180,975 |

Sources: Annual School Census Report 2025 – Ministry of Education

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.


අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල මාවත,
රාජගිරිය.

හඬ සඟරාව උපදේශක මණ්ඩලය
කේ. ඩී. පීරිස් මහතා, වජිර උමගලිය මහතා, මහින්ද සිල්වා මහතා, එම්. ඒ. ජේ. රියාස් මහතා, එස්. පී. මෝහන් මහතා

**1 වන පිටුවෙන්**

the cause of one or more clients at various levels to promote social justice – Richard Hoefer ( 2006)

Advocacy in social work means standing uo for the rights,dignity and well being of individuals and communities facing systemic challenges. This multi level approach operates at micro, mezzo and macro levels.

උද්දේශනයේ නිර්වචනය ලෙස, "කිසියම් කාරණයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් පෙනී සිටිමින්, ඒවාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට කරන ක්‍රියාමාර්ග" ලෙස හඳුන්වයි. මෙය වචන මට්ටමින් පමණක් නොව, ක්‍රියාත්මකවද සිදු වේ.

උද්දේශනයට උදාහරණයක් ලෙස

- පරිසරයේ ආරක්ෂාව වෙනුවෙන් හඬක් නැගීම, පෙනී සිටීම
- දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම
- අධ්‍යාපන අයිතින් වෙනුවෙන් කතා කිරීම වැනි ක්‍රියාමාර්ග සැලකිය හැකිය.

### උද්දේශනය සඳහා යොමු වන ආකාරය

### 1 යම් විශේෂ මාතෘකාවක් යොදා ගැනීම.

මෙහිදී සමාජයටම බලපෑමක් හෝ ගැටලුවක් වී පවතින හෝ අවශ්‍යතාවයක් ඇති මාතෘකාවක් තෝරා ගැනීම. පළමුව උද්දේශනය කිරීමට අවශ්‍යතාවය ඇති ප්‍රමුඛතම මාතෘකාවක් හෝ ගැටලුවක් හඳුනා ගැනීමෙන් එම කාර්ය කිරීම ඉතාමත් පහසු වේ. උදාහරණයක් ලෙස ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය ගැටලුවක් හෝ සාකච්ඡාවකට බඳුන් විය හැකි මාතෘකාවක් යොදා ගැනීම. ළමුන්ගේ අයිතිවාසිකම් කියූ විට එය එක් පුද්ගලයෙකුගේ අයිතියක් නොව සමස්ත සමාජයේම ගැටලුවක් වී ඇත. එය පොදු කරුණකි. එබැවින් ඒ වෙනුවෙන් පෙනී සිටීම හෝ කතා කිරීම ඉතාමත් පහසු කාර්යයකි. මෙම කාර්යය හුදෙක් තනි අරමුණක් වෙනුවෙන් නොව පොදු අරමුණක් වෙනුවෙන් සිදු කරන ලද්දකි. එහි ප්‍රතිඵල සමස්ත සමාජයටම යහපත් අරමුණක් ඉටු කිරීමට හැකි වේ. එබැවින් පළමුව උද්දේශන කාර්යයේ දී වඩාත් වැදගත් වන්නේ යහපත් මාතෘකාවක් තෝරා ගැනීමයි.

### 2 නිවැරදි වේදිකාවක් ලබා ගැනීම

උද්දේශනය සිදු කිරීමට සුදුසු වේදිකාවක් අවශ්‍ය වේ. එය විටෙක මුද්‍රිත මාධ්‍යයක් විය හැක. තවත් විටෙක එය සමාජ මාධ්‍යයක් විය හැක. එය පුද්ගල කණ්ඩායමක් හෝ සමාජ කණ්ඩායමක්, ජාලයක් විය හැක. මේ ආකාරයේ විවිධ වේදිකාවන් යොදා ගැනීමට අපට හැකි වේ. මේ අවස්ථාවේ දී අපට විවිධ ආයතන හා සංවිධානවල සහය ද ලබා ගැනීමට හැකි වේවි.එය උද්දේශන කාර්යයේ දී වඩාත් ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගැනීමට හොඳම අවස්ථාවක් වේ.

### 3 තොරතුරු රැස් කිරීම

උද්දේශන කාර්යේ දි වඩාත් වැදගත් වන්නේ සාක්ෂි එකතු කිරීමයි. ඔබ හෝ කණ්ඩායම පෙනී සිටීමට බලාපොරොත්තු වන මාතෘකාව හෝ කරුණ තුළ සාක්ෂි තොරතුරු සෙවීම අනිවාර්ය කාර්යයකි.මන්ද ඔබ සමාජයක් ඉදිරියේ නිවැරදි සත්‍ය තොරතුරු කතා කිරීම අනිවාර්ය වූවකි. උදාහරණයක් ලෙස ග්‍රාමීය පාසල්වල පවතින ගුරු පුරප්පාඩුව යන්න අපි සිතමු. මෙම කරුණ තුළ ඇති තොරතුරු එකතු කිරීම හා හඳුනා ගැනීම අනිවාර්ය වේ. එනම් ගුරු පුරප්පාඩු ඇති පළාත් ගණන, එම පළාත් වල වැඩිම ගුරු පුරප්පාඩු ඇති දිස්ත්‍රික්ක, වැඩි වශයෙන් ගුරු පුරප්පාඩු ඇති විෂයන් හා වැඩිම අවශ්‍යතා අවශ්‍ය වන අනුපිළිවෙළ යන්න විවිධ මාතෘකා ඔස්සේ තොරතුරු එකතු කිරීම ඔබට උද්දේශන කාර්යයේ දී වඩාත් ඵලදායී හා පහසු කාර්යක් වනු ඇත.

### 4 පාර්ශව හඳුනා ගැනීම

මෙහිදී ඔබට වෙනස් කළ යුතු අංශයට අදාල පාර්ශව හඳුනා ගැනීම සිදු කළ යුතුයි. ඔබ නිවැරදි පාර්ශව හා ඉලක්ක හඳුනා ගැනීම කළ යුතුයි. නිවැරදි පාර්ශව හඳුනා ගැනීමට අප අපොහොසත් වුවහොත් උද්දේශන කාර්ය අසාර්ථක වනු ඇත. මෙහිදී උදාහරණයක් ලෙස පාසල් වල ගුරු පුරප්පාඩු ගැටලු පිළිබඳ යැයි සිතමු. මෙහිදී අප වැඩිපුර අවධානය ලබා දිය යුත්තේ අධ්‍යාපන සම්බන්ධ නිළධාරීන් හා අදාල ආයතනයන් වලටය. එනම් කලාප කාර්යාලය, අධ්‍යාපන කාර්යාල වැනි ආයතනයන් වලටය. නැතහොත් එය මාර්ගස්ථ මඟී දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු කඩ මඩමක් සිදු විය හැක.

### 5 ක්‍රමවේද යොදා ගැනීම

උද්දේශන කාර්යේ වැදගත්ම අංගය වන්නේ උද්දේශනය සිදු කරන ක්‍රමවේදය නිවැරදිව හඳුනා ගැනීමයි. මෙහිදී සිදු කරන්නේ උද්දේශන කාර්ය සඳහා ගැටලුව සමඟ අදාල පාර්ශවයන්ගේ අවධානය යොදා ගැනීමට වඩාත් උචිත ක්‍රමවේදය යොදා ගැනීමයි. එහිදී ඔබට ඔබ කණ්ඩායමට අවශ්‍ය උද්දේශන කාර්ය සිදු කිරීමට හැකි වේ. මෙහිදී ඇතැම් අවස්ථා වල රැස්වීම්, සම්මුඛ සාකච්ඡා,දැනුවත් කිරීම්,සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කරන විවිධ උද්දේශන ක්‍රම භාවිතා කිරීම, ඇතැම් අවස්ථාවලදී ලිපි හෝ වාර්තා මඟින් උද්දේශනය කිරීම සිදු කළ හැක. මෙය උද්දේශන කාර්යයේ වැදගත්ම කාර්ය වේ. මෙහිදී අප නිවැරදි අවබෝධයකින් සිදු කළ යුතු කාර්යය වන්නේ මෙයයි.

### 6 පසු විපරම්

උද්දේශනය සිදු කිරීමේ දී එම කාර්යය එක් අංගයකින් අවසන් වූ විට එය සාර්ථක වේ යැයි ඔබ සිතිය හැක. නමුත් එය එසේ නොවේ. උද්දේශනය යනු එක් වරකින් අවසන් නොවන කාර්යකි. එය පියවරෙන් පියවර සිදු කළ යුතු දෙයකි. උද්දේශන කාර්යය සිදු කිරීමෙන් පසු අදාල අංශ ඒ පිළිබඳ ක්‍රියාත්මක වී තිබේ ද, යම් පියවරක් ලබා ගෙන ඇද්ද, කොතරම් දුරට උද්දේශන කාර්ය සාර්ථක වී ඇති ද යන්න විමසීම් කළ යුතුයි. උද්දේශන කාර්යේ පළමු පියවරෙන් සාර්ථකත්වය නොලැබුණු විට තවත් ක්‍රමවේද යොදා ගනිමින් උද්දේශනය සිදු කිරීම කළ යුතු වේ. මේ සියල්ලට බලපානු ලබන්නේ පසු විපරම හා හොඳ නිරීක්ෂණ කාර්යක් සිදු කිරීමයි.

සරලව ඔබේ හඬට වටිනාකමක් ලබා දීමට කළ යුතු පියවරයන් පිළිබඳ අපි දැනුවත් වුණෙමු. අප දැන් සොයා බලමු උද්දේශන කාර්යන් ඔස්සේ සමාජයේ වෙනස් සිදු කළ හා ඒ සඳහා උත්සහවන්ත වූ පුද්ගලයන්, පුද්ගල කණ්ඩායම් පිළිබඳ හඳුනාගත හැකිය.

මහත්මා ගාන්ධිතුමන් යනු ඉන්දියානු ඉතිහාසයේ පමණක් නොව ලොක ඉතිහාසයේ ද නොමැකෙන නාමයකි. ඉන්දියානු ජනතාවගේ නිදහස වෙනුවෙන් අවිහිංසාවාදී සාමකාමී විරෝධතා ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් උද්දේශනය සිදු කළ අපූර්ව මිනිසෙකි. 1930 වර්ෂයේ ලුණු සටන නමින් බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව කිලෝමීටර් 380 ක පමණ දුරක් පා ගමනක නිරත වීමයි. අවි ආයුධ නොමැතිව තම ඉල්ලීම් වෙනුවෙන් සටන් කළ අවිහිංසාවාදී උද්දේශන කාර්යයක නිරත වූ යුග පුරුෂයකි.

රෝසා පාකර්ස් යනු තනිවම තම අයිතිය වෙනුවෙන් හඬක් නැගූ අයෙකි. ඇයගේ මෙම නිහඬ ක්‍රියාව හුදෙක් සමාජයම උඩුකුරු කර ඇති ක්‍රියාවක් වේ. ඇය නාගරික අයිතිවාසිකම් සඳහා සටන් කළ කාන්තාවකි. මොන්ට්ගෝමරි බස් වර්ජනය ඒ සඳහා හොඳම නිදසුන විය. කලු සුදු වර්ණභේදය හේතුවෙන් නගරයේ බස් රථවල ගමන් කිරීමේ දී සුදු ජාතිකයන් පැමිණි විට කලු ජාතිකයන් විසින් අසුන අත්හැරීම හෝ ලබා දීම කළ යුතු වේ. එය නිතියක් විය. නමුත් ඇය එක් අවස්ථාවකදී එය ප්‍රතික්ෂේප කරන ලදී. ඇයගේ මෙම ක්‍රියාවත් සමග කලු ජාතිකයන් මාස 13ක් පුරාවට බස් සේවාව වර්ජනය කරන ලදී. මේ හේතුව නිසා නිතියක් ලෙස පැවති කලු සුදු ජාතින් අතර බස් රථවල වර්ග භේදය නිමාවට පත් විය.

මේ ආකාරට ලෝකයේ විවිධ පොදු අරමුණු වෙනුවෙන් නිහඬ, විධිමත්, වෙනස් ආකාරයේ උද්දේශන කාර්යන් විටින් විට සිදු කරන ලදී. එය හුදෙක් තමාගේ අරමුණක් වෙනුවෙන් නොව සමස්ත ජනයාගේ පොදු කරුණක් වෙනුවෙන් කටයුතු කිරීමයි.උද්දේශනය සිදු කරන්නේ විප්ලවයකට නොව යහපත් සමාජ අරමුණක් ඉටු කර ගැනීම සඳහායි. ඔබටත් සමාජයේ යහපත් අරමුණක් වෙනුවෙන් කතා කිරීමට, ලිවීමට මෙන්ම සාකච්ඡා සිදු කිරීමට අවස්ථාව ඇත. මෙය පොදු අරමුණක් සඳහා ඔබේ හඬට වටිනාකමක් ලබා දීමට හැකි හොඳම අවස්ථාවකි.

**මිහිසරණි ගුණතුංග**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

**නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල ප්‍රධාන උපයාමාර්ගික කුරුණු**

1. විෂය නිර්දේශ සංවර්ධන
2. මානව සම්පත් සංවර්ධන (ගුරු පුහුණුව )
3. යටිතල පහසුකම් සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ
4. තක්සේරු හා ඇගයීම
5. මහජනතාව දැනුවත්භාවය හා ප්‍රවර්ධනය

# හඬක් නැගූ දිරිය කත - මලාලා යුසුෆ්



එක් දරුවෙක්ට, එක් ගුරුවරයෙක්ට, එක් පොතකට, එක් පෑනකට ලෝකයක් වෙනස් කළ හැකියි. මේ ලෝකයේම අවධානය දිනා ගත් අපූර්ව කතාවක නිමැවුම්කාරියයි. ඇය කාන්තාවන්ගේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් හඬක් නැගූ දැරිය **මලාලා යුසුෆ්** වේ. 1997 වසරේ දී ජුලි 12 දින පකිස්ථානයේ උපත ලැබූ ඇය කුඩා කල සිට අධ්‍යාපනය වෙනුවෙන් නැඹුරුවක් වූ අයෙකි. ඇයගේ පියා ගුරුවරයෙක් වූ අතර අධ්‍යාපනයේ ඇති වැදගත්කම ඇයට කුඩා කළ සිට පෙන්වා දුන්නේය. පියාගේ ගුරුහරුකම් යටතේ හැදුන මලාල නිදහසේ කතා කිරීමටත් අදහස් ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලැබුණි. ක්‍රමයෙන් සමාජ අවබෝධය ලබා ගනිමින් ඉතා ඉක්මනින් ඇගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමේ වැදගත්කම අවබෝධ කර ගත්තාය.

වයස අවුරුදු 11 දී ඇගේ පැන යොදා ගනිමින් ජීවිතය වෙනස් මාවකට ගෙන යන ලදී. ඇය අවුරුදු 11 දී BBC හි තලෙයිබාන් පාලනය යටතේ ගැහැණු දරුවන්ගේ පාසල් ගමනට වෙන ගැටලු හා බාධාවන් පිළිබඳ පෑනෙන් ලිවීමට කටයුතු කරන ලදී. ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය මේ ඔස්සේ අඩාල වන ආකාරය මොවුන් මුහුණ දෙන අපහසුතා පිළිබඳව ඇය ලිවීමට පටන් ගත්තාය. ඇගේ එම ක්‍රියාව මුලු ලෝකයේම අවධානය ගැනීමට සමත් විය.

2012 වර්ෂයේ දී ඇගේ ජීවිතය වෙනසකට පත්විය. එනම් ඇය පාසල් අවසන් වී නිවසට පැමිණෙන විට තලෙයිබාන් සංවිධානයේ වෙඩිකරුවෙකුගේ ප්‍රහාරයකට මුහුණ දෙන ලදී. එයින් ඇය බරපතල ලෙස තුවාල ලැබීය. ප්‍රතිකාර සඳහා ඇය එක්සත් රාජධානියට යන ලදී. මේ බාධා හමුවේ වුවද ඇගේ අරමුණ වෙනුවෙන් ඇය සටන අත්නොහලේය. අධිෂ්ඨානය කැපවීම මත ඇය ඇයගේ අරමුණ වෙනුවෙන් කටයුතු කලාය. මෙම අනතුරෙන් පසු ඇය සුවය ලබා ලෝකයේම අවදානය දිනාගත් ගෝලිය උපදේශකවරියක් බවට පත් විය. ඇය ගැහැණු ළමයින්ගේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සමුලුවේ දී සාකච්ඡාවක් සිදු කරන ලදී. එම කතාව ද මුලු ලෝකයේම අවදානය ඇය වෙත ලබා ගැනීමට හැකි විය.

ලාබාලතම නොබෙල් සාම ත්‍යාගය හිමිකාරිය බවට පත් වූයේ ද ඇයයි. ඒ 2014 වර්ෂයේ දීය. ඇගේ නමින් ලෝකය පුරා සිටින ගැහැණු ළමයින්ට අධ්‍යාපන අවස්ථා ලබා දීමට උපකාර කරනු ලබන Malala Fund එක ආරම්භ කරන ලදී. ඇයගේ එම කාර්ය මගින් ලොවක් ඉදිරියේ හඬක් නැගීමත් යහපත් සමාජයක් බිහි කිරීමටත් උපකාර විය. සෑම අයෙකුටම හොඳ ආදර්ශයක් විය. මන්ද ඇය කුමන බාධාව පැමිණිය ද අරමුණ වෙනස් කලේ නැත. ජයග්‍රහණය ලබන තෙක්ම සටන් කරන ලදී.

# සිවිල් සමාජ උද්දේශන ක්‍රම

සිවිල් සමාජ උද්දේශන ක්‍රම (Civil Society Advocacy Methods) යනු ජනතාවගේ අයිතිවාසිකම්, අවශ්‍යතා සහ සමාජ ගැටළු පිළිබඳ රජය, ආයතන හෝ මහජනතාව දැනුවත් කරමින් වෙනසක් ඇති කිරීමට භාවිතා කරන ක්‍රමවේදයන්ය. ප්‍රධාන උද්දේශන ක්‍රම කිහිපයක් පහත දැක්වේ:

**දැනුවත් කිරීමේ වැඩසටහන්**

- සම්මන්ත්‍රණ
- වැඩමුළු
- ජනහමු
- පෝස්ටර්, ලිපි හා පත්‍රිකා බෙදාහැරීම

**මාධ්‍ය භාවිතය**

- රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන්
- පුවත්පත් ලිපි
- සමාජ මාධ්‍ය (Facebook, YouTube,TikTok ආදිය)

**ප්‍රතිපත්ති සංවාද සහ සාකච්ඡා**

- රජයේ නිලධාරීන් සමඟ හමුවීම්
- ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම
- වාර්තා හා පර්යේෂණ ඉදිරිපත් කිරීම

**ජනතා ව්‍යාපාර සහ උද්ඝෝෂණ**

- සාමකාමී පෙළපාලි
- විරෝධතා
- අත්සන් එකතු කිරීමේ ව්‍යාපාර

**ජාලගත වීම සහ සන්ධාන ගොඩනැගීම**

- වෙනත් සංවිධාන සමඟ එකතුව ක්‍රියා කිරීම
- ප්‍රජා කණ්ඩායම් සහභාගී කරගැනීම

**නීතිමය උද්දේශනය**

- අයිතිවාසිකම් සම්බන්ධ නඩු පැවරීම
- නීති සංශෝධන සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

**පර්යේෂණ හා දත්ත භාවිතය**

- සමීක්ෂණ පැවැත්වීම
- වාර්තා සකස් කිරීම
- සාක්ෂි මත පදනම් වූ උද්දේශනය

**ඩිජිටල් උද්දේශනය**

- Hashtag campaigns
- Webinar සහ online campaigns

# අධ්‍යාපන සාමාන්‍ය දැනීම

1. ශ්‍රී ලංකාවේ වැඩිම අධ්‍යාපන කලාප ඇති දිස්ත්‍රික්කය වන්නේ - අම්පාර දිස්ත්‍රික්කය (07)
2. ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වන්නේ - සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා
3. නිදහස් ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වන්නේ - ඊ. ඒ. නුගවෙල මහතා
4. ශ්‍රී ලංකාවේ ප්‍රථම විභාග කොමසාරිස් වන්නේ - එල්.එල්.කේ. ගුණතුංග මහතා
5. ශ්‍රී ලංකාවේ පළමු විදුහල්පතිනිය වන්නේ - අනුලා මැණිකේ උදලාගම මහත්මිය
6. මෙරට පළමු රජයේ පාසල වන්නේ - කොළඹ රාජකීය විද්‍යාලය
7. මෙරට පළමු බෞද්ධ පාසල වන්නේ - දොඩන්දූවේ පියරතන මහා විද්‍යාලය
8. මෙරට පළමු හින්දු පාසල වන්නේ - යාපනය හින්දු විද්‍යාලය
9. මෙරට පළමු මුස්ලිම් පාසල වන්නේ - මරදාන සහිරා විද්‍යාලය
10. ශ්‍රී ලංකාවේ ප්‍රථම බාලදක්ෂයා ලෙස ලියාපදිංචි වූ පුද්ගලයා වන්නේ - ජී.එස්. ප්‍රනාන්දු මහතා
11. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිවරයා වන්නේ - කපිල සෙනෙවිරත්න මහතා
12. සාර්ක් විශ්වවිද්‍යාලය පිහිටා ඇත්තේ - නවදිල්ලී
13. දිට්වා සුළිකුනාටුවෙන් ආපදාවට ලක් වූ, එක පාසල් දරුවෙක් සඳහා රජය පිරිනැමූ ආධාර මුදල - රු. 25000
14. ශ්‍රී ලංකාවේ පළමු ත්‍රෛභාෂා පාසල පිහිටා ඇත්තේ - පොළොන්නරුවේ
15. ශ්‍රී ලංකාවේ පාසල් වර්ගීකරණය අනුව

- 1AB පාසල් - අ.පො.ස. (උසස් පෙළ ) විද්‍යා, කලා, වාණිජ, තාක්ෂණ යන විෂය ධාරාවන් සහිත පාසල්
- 1C පාසල් - අ.පො.ස. (උසස් පෙළ ) කලා හා වාණිජ විෂය ධාරා හෝ ඉන් එක් විෂය ධාරාවක් සහිත පාසල්, විද්‍යා විෂය ධාරාව නොමැති පාසල් ය. ඇතැම්විට තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක වේ.
- 2 වර්ගයේ පාසල් - 1-11 ශ්‍රේණි / 1-9 ශ්‍රේණි හෝ 6 - 11 ශ්‍රේණි දක්වා පන්ති පැවැත්වෙන පාසල්
- 3 වර්ගයේ පාසල් - 1-5 ශ්‍රේණිය (ප්‍රාථමික අංශය) පමණක් ඇති පාසල් හා 1-8 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල්.

# Youth-Led Protests and Policy Change: from Sri Lanka & Southeast Asian region




The rise of the youth community for global political change can be seen within Sri Lanka and the broader Southeast Asian region, both in the past and in the present. The world changing duty is always associated with the youth in the world. The Youth-led protests have focused on addressing all the population's issues, through Social-cultural, economic, and political contexts. It has a positive impact or a negative impact in-country. And also, it will be a critical situation or Turing point. This article enunciates the youth uprising movements in Sri Lanka, and the objective of writing this article is to share the value of doing a democratic revolution to change world politics, especially in an undemocratic system. In addition, this article has covered the importance of youth engagement for policy-making in Sri Lanka and Southeast Asia. Also, this article intends to explore youth political participation, the youth uprising movements in world history, the History of the youth uprising movement in Sri Lanka,

**The Youth uprising movement in Sri Lanka and Southeast Asian region**

"Youth refers to individuals typically aged 15 to 29 years (as recognized in Sri Lanka and the Commonwealth), who are in a transitional stage between dependence and independence, and who play an increasingly active role in social, economic, and political life." In my opinion, the youth population is dynamic, energetic, and powerful. In geopolitical context There are some significant youth uprising movements in world political history as Vietnam War Protest, Indonesia (Reformasi Movement 1998, Thailand (Student Uprising / 14 October 1973), Philippines (People Power Revolution, "EDSA Revolution" 1986), Sri lanka - Janatha Vimukthi Peramuna (JVP 1971) Insurrection, Sri Lanka 1987 – Youth-Led Protests and the JVP Insurrection (Second Uprising 1987) etc.

In recent years, youth-led uprisings have emerged as a powerful force shaping political and social change across the world. In Sri Lanka, the 2022–2023 Aragalaya movement saw students and young professionals mobilize against government corruption and economic mismanagement, culminating in the resignation of President Gotabaya Rajapaksa. Similarly, in Indonesia, the 2025 "Dark Indonesia" protests were led by university students opposing budget cuts, rising living costs, and threats to education, prompting policymakers to reconsider austerity measures. In the Philippines, youth activists organized large-scale demonstrations addressing corruption, climate policy failures, and social inequality, increasing pressure on government transparency. Thailand witnessed pro-democracy youth protests between 2020 and 2023, with students demanding constitutional reforms and expanded civil liberties, while in Hong Kong (2019–2020), young people led massive demonstrations against the extradition bill and broader restrictions on democratic rights. Across these movements, common patterns

emerge: young people leverage digital platforms for mobilization, challenge political authority, advocate for transparency and social justice, and increasingly influence policy outcomes, highlighting the growing global role of youth as agents of change.

**Brief history of the uprising movement in Sri Lanka.**

The youth uprising movement is not a new phenomenon in Sri Lanka. The country has experienced religious, and political radicalization. When studying the history of Sri Lanka, there were significant youth radicalization movements as follows:

Youth radicalization in Sri Lanka has evolved through multiple phases, shaped by political, ethnic, and social tensions. In the 1930s, radicalization emerged alongside the rise of the workers' and leftist movements, followed by Tamil youth mobilization in the North and plantation areas between 1939 and 1940. The mid-20th century saw negative radicalization used by Sinhala Buddhist nationalists to fuel communal violence against Tamils and Muslim minorities, particularly in 1956 and 1958. The 1971 Janatha Vimukthi Peramuna (JVP) uprising, described by K.M. De Silva as the largest youth revolt in the country's history, marked the entry of armed struggle into youth activism. Subsequent decades witnessed the rise of the LTTE (1971–1994), the re-emergence of a more organized JVP in the mid-1980s, and targeted violence against Tamil civilians, including the burning of Jaffna University Library in 1982 and the Black July pogrom of 1983. Amid this turmoil, southern youth initiated non-violent campaigns (1987–1989) using methods like Padayathra and Sathyagraha, supported by NGOs, to counter JVP violence and advocate for human rights (Jayamaha, 2022). Post-war, Sinhala Buddhist extremism has been strategically leveraged by political leaders to consolidate power, while university students, particularly through the Inter University Students Federation (IUSF), continue to play a significant role in political engagement and activism.

**Youth Uprising Movements 'Aragalaya' in Sri Lanka 2022**

The 2022 Aragalaya Movement in Sri Lanka represented a significant socio-political phenomenon arising from one of the most severe economic and political crises in the country's post-independence history. The movement was rooted in deep economic mismanagement, unsustainable foreign debt, and persistent corruption within the ruling regime. The collapse of key revenue sources, particularly tourism and foreign remittances during the COVID-19 pandemic, further exacerbated the crisis, leading to acute shortages of fuel, food, and medicine. This economic breakdown, combined with growing disillusionment over nepotism and poor governance by the Rajapaksa administration, mobilized citizens across social, ethnic, and professional boundaries. The Aragalaya, meaning "struggle," evolved into a broad-based, non-partisan citizens' movement demanding accountability, democratic reforms, and an end to systemic corruption. Social media networks, through campaigns such as #GoHomeGota and #GotaGoGama, served as critical tools for political mobilization, information dissemination, and collective action.

Central to the Aragalaya was GotaGoGama, a symbolic protest site established at Galle Face Green in Colombo, which became a locus for civic engagement, dialogue, and cultural expression. The sustained protests culminated in significant political outcomes, including the resignations of Prime Minister Mahinda Rajapaksa in May and President Gotabaya Rajapaksa in July 2022, signaling a transformative moment in Sri Lanka's democratic trajectory. Subsequently, Ranil Wickremesinghe assumed the presidency, and the 21st Amendment to the Constitution was enacted, aiming to curtail executive powers and enhance parliamentary oversight. Nonetheless, the post-protest period revealed continuing governance challenges, including the suppression of dissent, the use of the Prevention of Terrorism Act (PTA) against activists, and ongoing socio-economic instability. Despite these limitations, the Aragalaya stands as a pivotal instance of civic empowerment, illustrating the capacity of collective citizen action to redefine democratic participation and promote political accountability in Sri Lanka.

**Youth Engagement for Policy changes in Sri Lanka**

The Aragalaya movement of 2022 represented a pivotal instance of youth engagement in policy discourse and socio-political transformation in Sri Lanka. Confronted with severe economic instability, governance failures, and institutional corruption, the country's youth mobilized to demand structural reforms and greater accountability from state authorities. Their involvement extended beyond traditional protest mechanisms, incorporating digital activism, policy advocacy, and civic education to articulate the demand for a "system change." This engagement reflected a shift from passive political participation to active citizenship, wherein young people positioned themselves as critical stakeholders in shaping national policy agendas. The Aragalaya thus underscored the transformative potential

of youth agency in democratization processes and in redefining the contours of participatory governance in Sri Lanka.

- Recruiting Youth Representatives for Sectoral Oversight Committees

In 2023, Sri Lanka took a progressive step toward youth inclusion in governance by recruiting youth representatives to participate in Parliamentary Sectoral Oversight Committees. These committees are responsible for monitoring and reviewing the performance of government ministries and institutions in specific policy areas such as education, environment, health, and finance. Through this initiative, over 500 youth between the ages of 18 and 35 were selected from across the country to engage directly with parliamentarians and contribute to policy discussions. This marks the first time in Sri Lanka's history that young citizens were formally included in the legislative oversight process. The initiative aimed to strengthen democratic participation, improve transparency, and empower youth as active partners in governance rather than passive observers. It also reflected lessons from the 2022 Aragalaya movement, where youth demanded systemic reforms and a more accountable political culture.

- Statement by Former President Ranil Wickremesinghe

In his speech from the throne delivered in Parliament, former President Ranil Wickremesinghe emphasized his commitment to expanding opportunities for youth participation in political and decision-making processes. He acknowledged the critical role that young people played in shaping the national reform agenda and stated that the government intends to open more avenues for youth engagement in the upcoming elections. His statement indicated a policy shift toward recognizing youth as key stakeholders in national governance, moving beyond symbolic representation to institutionalized participation. This vision aligns with global trends that advocate for integrating youth perspectives into formal political systems to enhance innovation, accountability, and sustainability in policymaking.

- Providing a 25% Youth Quota

To further institutionalize youth participation, Sri Lanka has proposed introducing a 25% youth quota in local government and provincial council elections. This policy would require that at least one-fourth of all candidates nominated by political parties be youth under the age of 35. The objective of this reform is to address the underrepresentation of young people in formal politics, promote generational diversity in leadership, and create a pathway for young leaders to contribute to public policy and governance. The quota system is designed to complement existing gender representation mechanisms and to ensure that youth perspectives are reflected in decision-making at all levels of government. If effectively implemented, the 25% quota could help bridge the gap between youth activism seen vividly during the Aragalaya movement and sustained participation within democratic institutions.

Summary

Many recent youth-led protests are driven by economic pressures and rising costs of living, with frustration over inflation, subsidy cuts, and underfunded public services. Protesters also respond to perceived injustice and misuse of public funds, such as extravagant government spending, corrupt infrastructure projects, or unfair allowances for politicians. Young activists demand political accountability and reforms, calling for greater transparency and meaningful government action. They increasingly leverage social media and youth networks to organize decentralized movements and amplify their voices. Additionally, these movements often center on rights and democratic participation, including voting rights, fair representation, and checks on elite power, reflecting a generational push for systemic change.

**K.A.Rangani Lakmali,**
**Coalition for Educational Development, Sri Lanka.**

ගාලු කුමාරියේ .....



පඩිපතට වෙහෙසන දිවි
ගාලුසිරි රැගෙන කොළඹට ආසිරි
මුහුදු සුළගත් එතී
පැමිණේවි අදත් සාගරිකා නිති.

විවිධ වූ දිවි ඇති
මිනිසුන් හමුවන නිති
දුම්රියත් හරි අපූරු ගමනකි.

පොතක පිටු අතර සිර වූ
කතා වැනි
ඇත විවිධ මිනිසුන් එහි
ලියන්නට සිතුනි මට කවි නිතී.

මිහිසරණී ගුණතුංග

# විවිධ පාසල් සංකල්ප

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ විවිධ කාලවකවානුවලදී හඳුන්වා දුන් පාසල් සංකල්ප හා ව්‍යාපෘති බොහොමයක් අධ්‍යාපන සාැත්මතාවය, ප්‍රවේශය සහ සම්පත් කාර්යක්ෂම භාවිතය ඉහලක්ක කරගෙන ක්‍රියාත්මක කර ඇත.

- **ඉසුරු පාසල් (Isuru Schools)** - ඉසුරු පාසල් (Isuru Pasal) ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කරන ලද්දේ 2007 වසරේදී වේ. කාලය තුළ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ ග්‍රාමීය ප්‍රදේශවල ද්විතීයික අධ්‍යාපනය ශක්තිමත් කිරීමයි. ජාතික පාසල්වලට පවතින අධික ඉල්ලුම අඩු කරමින්, ප්‍රාදේශීය මට්ටමින් තෝරාගත් පාසල් නවීන පහසුකම් (විශේෂයෙන් විද්‍යා හා තොරතුරු තාක්ෂණ පහසුකම්) සමඟ සංවර්ධනය කරන ලදී.
- **පොකුරු පාසල් (School Clusters)-** 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ධවල පත්‍රිකාව මගින් යෝජනා කර 1980 දශකයේදී ක්‍රියාත්මක කරන ලදී. කුඩා පාසල් කිහිපයක් ප්‍රධාන පාසලක් වටා එකතු කර සම්පත් බෙදාගැනීම මෙහි මූලික ලක්ෂණයයි. විද්‍යාගාර, පුස්තකාල, ක්‍රීඩා පහසුකම් හා ගුරු සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම මෙහි අරමුණ විය.
- **පර්ශද පාසල් (School Complexes / School Families)-** 1980 දශකයේ අගභාගයේදී පොකුරු පාසල් සංකල්පයේ විකල්පයක් ලෙස හඳුන්වා දෙන ලදී. භූගෝලීයව සමීප පාසල් සමූහයක් එකට එක්ව සැලසුම්ගත පරිදි ක්‍රියාත්මක වීම මෙහි ලක්ෂණයයි. පාසල් අතර සහයෝගීතාවය හා අධ්‍යාපනික ප්‍රමිතීන් උසස් කිරීම මෙහි අරමුණ විය.



**දෙවරක් සිතා බලන්න**

ලොක්කා තම පිරිස් දක්කනවා - නායකයා තම පිරිස් දිරිගන්වනවා

ලොක්කා බලය පතුරනවා - නායකයා හොඳහිත පතුරනවා

ලොක්කා බිය ඇති කරවනවා - නායකයා දයාව විහිදවනවා

ලොක්කාගේ කතාව " මම" ගැන - නායකයාගේ කතාව " අපි " ගැන

ලොක්කා නිතරම වැරදිකරු සොයයි - නායකයා නිතරම වරද කොතැනද සොයයි

ලොක්කා කාර්ය කළ යුතු අන්දම හොඳින් දන්නවා - නායකයා කාර්ය කළයුතු අන්දම හොඳින් දක්වනවා

ලොක්කා තම පිරිස් ගැරහුමට ලක්කරනවා - නායකයා තම පිරිස් නිසිලෙස කාර්යෙහි යොදවනවා

ලොක්කා කීර්තිය බලෙන් ලබා ගන්නවා - නායකයා කීර්තිය ඉබේ ලබාගන්නවා

ලොක්කා රාජකාරිය හිසරදයක් කරගන්නවා - නායකයා රාජකාරිය ආස්වාදයක් කරගන්නවා

- **නවෝදයා පාසල් (Navodya Schools) -** මෙම ව්‍යාපෘතිය "සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් සම්පූර්ණ පහසුකම් සහිත ද්විතීයික පාසලක්" යන සංකල්පය මත පදනම් විය. ජනප්‍රිය පාසල් වෙත ඇති තදබදය අඩු කරමින්, ග්‍රාමීය සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනය තම ප්‍රදේශයේදීම ලබාදීම මෙහි ප්‍රධාන අරමුණයි.
- **මිතුරු පාසල් (Sister / Partner Schools)-**2000 දශකයේදී විශේෂයෙන් ව්‍යාප්ත වූ මෙම සංකල්පය යටතේ, දේශීය හා විදේශීය පාසල් අතර අධ්‍යාපනික හා සංස්කෘතික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ගුරුවරුන්ගේ හා සිසුන්ගේ අත්දැකීම් හුවමාරුව සහ නව ඉගෙනුම් ක්‍රම හඳුනාගැනීම මෙහි අරමුණ වේ.
- **ළමා මිතුරු පාසල් (Child-Friendly Schools – CFS)-** 2002 දී නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර, UNICEF සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරන ලදී. දරුවාගේ ආරක්ෂාව, සෞඛ්‍යය, සහභාගීත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කරන, දරුවාට හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වේ. ශාරීරික දඬුවම්වලින් තොර සහ සමානාත්මක අවස්ථා ඇති පරිසරයක් මෙහි ප්‍රධාන ලක්ෂණයකි.
- **සුහුරු පාසල් (Smart Schools)**- 2016-2017 කාලයේ සිට ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ඒකාබද්ධ කර ඇත. සුහුරු පන්තිකාමර, අන්තර්ජාල පහසුකම් සහ ඩිජිටල් ඉගෙනුම් මෙවලම් භාවිතය මෙහි ප්‍රධාන ලක්ෂණ වේ.

**වර්තමාන ප්‍රවණතා සහ ප්‍රතිසංස්කරණ**

National Education Policy Framework- 2023-2033 යටතේ පාසල් පද්ධතිය තවදුරටත් ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලියක් සිදු වෙමින් පවතී.

පාසල් "පොකුරු" හෝ "නවෝදයා" වැනි ව්‍යාපෘතිමය වර්ගීකරණවලින් ඉවත් වී School Boards ලෙස වඩා සංවිධානාත්මක පාලන ව්‍යුහයක් හඳුන්වාදීමට යෝජනා වී ඇත.

2026 සිට ක්‍රියාත්මක වන නව විෂය මාලාව සමඟ සෑම පාසලකම අවම වශයෙන් එක් සුහුරු පන්තිකාමරයක් ස්ථාපිත කිරීම ප්‍රධාන ඉලක්කයකි. තාක්ෂණය, ජීවිත කුසලතා සහ රැකියා සම්බන්ධ ඉගෙනුම ප්‍රමුඛතාවයක් ලබාදී ඇත.

# ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනය සම්බන්ධයෙන් පිරිවෙන් අධ්‍යාපනය දක්වා වූ දිගු ඉතිහාසයක් පවතී. ඒ පිළිබඳව 1943 කන්නන්ගර විශේෂ කමිටු වාර්තාවෙන් තවදුරටත් අවධාරණය කර ඇත. එසේ වුවද, ගුරු අධ්‍යාපනයේ නව ප්‍රවණතාවක් ඇති වන්නේ පූර්ව සේවා ගුරු පුහුණු අධ්‍යාපනයක බලවත් අවශ්‍යතාව හඳුනාගත් පසුගිය අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන් 1986 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යවරයා ව සිටි කාලපරිච්ඡේදයේ දී ඉදිරිපත් කරනු ලැබූ 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත මගිනි. මෙම පනත මගින් අධ්‍යාපනික විද්‍යායතන හෙවත් වර්තමානයේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භ කිරීමේ නීතිමය ප්‍රතිපාදන සම්මත විය. ඒ හේතුවෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ නමින් හඳුන්වන පූර්ව සේවා ගුරු පුහුණු ආයතන ජාලයේ ආරම්භය සනිටුහන් විය.

"ජාතික අධ්‍යාපන අභිමතාර්ථ ඉටු කරලීමට වෘත්තීය නිපුණතාව හා කැපවීම සහිත අනාගත අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය දක්ෂතාව, උද්යෝගය හා නවතාවයෙන් හෙබි ගුරුවරයෙකු පාසල් පද්ධතියට දායක කිරීම" යන මෙහෙවර සහ "පූර්ව සේවා හා අඛණ්ඩ අධ්‍යාපනය තුළින් විශ්ව සමාජයේ ප්‍රගතියට දායක වියහැකි දක්ෂ වෘත්තීය නිපුණතාවෙන් හෙබි ගුරුවරයෙකු බිහි කිරීම" යන එකම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සතු වේ.

ආරම්භයේ දී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව හයකට සීමා විය. ඒවා ද ආරම්භ කරන ලද්දේ එම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භ කළ ප්‍රදේශවල තිබූ ගුරු විද්‍යාල පවරා ගනිමින් ඒවායේ භෞතික සම්පත් වැඩි දියුණු කිරීමෙනි. ආරම්භයේ අධ්‍යාපන විද්‍යාපීඨ ලෙස හඳුන්වනු ලැබූ ආයතන පසුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ යනුවෙන් හැඳින්විය. මේ වනවිට සංඛ්‍යාත්මකව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 20 ක් දක්වා වැඩි වී ඇති අතර, ඒවා පහත දැක්වේ.

**01. මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**02. සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**03. හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**04. පස්දුන් රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**05. ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**06. සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**07. නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**08. ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**09. අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**10. වව්නියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**11. මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**12. පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**13. වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**14. රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**15. රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**16. යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**17. දර්ගානගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**18. පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**19. මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**
**20. කුලියාපිටිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය**

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීමේ වයස අවුරුදු 22 - 25 අතර පරාසයක පවතී. නමුත් කතෝලික පාඨමාලාව සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 30 ක් වන අතර බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 27 කි. ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ දී අන්තර් ජාතික, ජාතික, පළාත් හෝ කලාප ක්‍රීඩා දක්ෂතා දැක්වූවන්ට ප්‍රමුඛතාව ලබා දේ.

ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවා ගැනීමේ දී ඉන්දීය සම්භවයක් ඇති වතුකරයේ දෙමළ සිසුන් සඳහා සියයට 75 ක ප්‍රමුඛතාවක් ලබා දීම සිදු කෙරේ. අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා බඳවා ගැනීමේ දී මුස්ලිම් සිසුන් සඳහා වැඩි ප්‍රමුඛතාව ලබා දේ. විද්‍යාපීඨවලට බඳවා ගැනීමේ දී අනුගමනය කරන මෙවන් නිර්ණායක නිසා සුළු ජන කොට්ඨාසවලට අධ්‍යාපනයේ සම අයිතිවාසිකම් ලබා දීම ද තහවුරු කෙරේ. දෑ අවුරුදු ආයතනික පුහුණුවකින් හා එක් අවුරුදු සීමාවාසී කාල පරිච්ඡේදයකින් සමන්විත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලාව සුවිශේෂී ඇගයීම් ක්‍රියාවලියකට ලක් වන පූර්ව සේවා ගුරු පුහුණු විද්‍යා පීඨය තුළ ක්‍රියාත්මක දෑ අවුරුදු පාඨමාලාවේ සෑම දිනකම උදයේ ශාරීරික යෝග්‍යතා ව්‍යායාම වලින් ඇරඹෙන ශික්ෂණලාභීන්ගේ දෛනික කාර්ය සවස 6 ට පමණ අවසන් වේ. සෙනසුරාදා උදය වරුව විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට වෙන් වන අතර ඉරිදා දිනය විවේකී දිනයක් වේ. විද්‍යා පීඨයේ ක්‍රියාත්මක වන පාඨමාලා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත් වේ. ප්‍රාථමික අධ්‍යාපනය, විද්‍යාව, ගණිතය, කෘෂිකර්මය, ශිල්ප කලා, බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කතෝලික ධර්මය, චිත්‍ර, නැටුම්, සංගීතය, භරත නාට්‍යම්, කර්ණාටක සංගීතය, සාමාජීය විද්‍යාව, පළමු අධ්‍යාපන වැඩසටහනකි.

දෙවන බස, ශාරිරික අධ්‍යාපනය, වාණිජ, විශේෂ අධ්‍යාපනය සහ ගෘහ ආර්ථික විද්‍යාව යන විෂය සඳහා පාඨමාලා දැනට ක්‍රියාත්මක වේ. දෑ අවුරුදු ආයතනික පුහුණු කාල සීමාවේදී වෘත්තීය විෂය, හා සාමාන්‍ය විෂය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක නියැලීමට ශික්ෂණලාභීන්ට අවස්ථාව ලැබේ. එම කාලය තුළ සෑම විද්‍යාපීඨයක ම ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී වැඩසටහන් වන බාල දක්ෂ, ශිෂ්‍ය භට, සමිති සමාගම්, ක්‍රීඩා අධ්‍යාපනික චාරිකා, සංදර්ශන, ආගමික වැඩ සටහන්, ප්‍රජා ව්‍යාපෘති, සෞන්දර්ය වැඩසටහන්




මෙන්ම විශේෂ වූ දිනයන් සැමරීම සහ උදෑසන රැස්වීම පැවැත්වීම ශික්ෂණලාභීන්ගේ නායකත්ව ශක්‍යතා වර්ධනය කිරීම මෙන්ම සමබර පුද්ගල පෞරුෂයක් ගොඩනැංවීම සඳහා ඉවහල් වේ.

එක් අවුරුදු සීමාවාසී කාල සීමාවේ පරමාර්ථය වන්නේ විශ්වාසයෙන් හා නිපුණතාවයෙන් යුක්ත ව අවශ්‍ය ගුරු කාර්යයේ නිරත වන්නාවූ ආත්ම ශක්තියෙන් යුත් වෘත්තිකයන් බවට පත් වීම පිණිස දෑ අවුරුදු ආයතනික කාල පරිච්ඡේදයේ දී අත්පත් කර ගන්නා ලද දැනුම, කුසලතා හා ආකල්ප ව්‍යවහාර කිරිම සඳහා ශික්ෂණලාභීන්ට අවස්ථා ලබා දීමයි. එමෙන්ම මෙම සීමාවාසී කාලසීමාවේ දී පාසල් ගුරුවරුන් ලෙස ස්වකීය භූමිකාව හා වගකීම නිවැරදි ව වටහා ගෙන වැඩෙහි යෙදීම, ප්‍රාථමික හා ද්විතීයික පාසල් විෂය මාලාවට පදනම් වූ විෂය නිර්දේශවලට අනුව පාඩම් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, පාසල් ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් අවශ්‍යතා හා පෞරුෂ සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඔවුන් සමඟ සාර්ථක ලෙස කාර්යයන්හි නිරතවීම ආදී වූ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ. සීමාවාසී කාල සීමාවේ දී ශික්ෂණලාභීන් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සංවිධානය, ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ඇගයීම් කටයුතු කළමනාකරණය සඳහා විද්‍යාපීඨයේ සීමාවාසික කමිටුවක් පිහිටුවා ඇත. පීඨාධිපති, උප පීඨාධිපති (අධ්‍යාපන හා ගුණාත්මක) උප පීඨාධිපති (අඛණ්ඩ අධ්‍යාපන) එක් අංශාධිපතිවරයෙක් හා එක් ඉගැන්වීම් මාධ්‍යයකින් එක් ගුරු අධ්‍යාපනඥයකු බැගින් ද පීඨයේ පවත්නා එක් එක් පාඨමාලා නියෝජනය වීමට එක් ගුරු අධ්‍යාපනඥයෙකු ද මෙම සීමාවාසී කමිටුවට අයත් වේ.

මේ ආකාරයට අවුරුදු තුනක් මුළුල්ලේම වෘත්තීය, විශේෂ සහ සාමාන්‍ය යන විෂය ක්ෂේත්‍ර තුනක් යටතේ ශික්ෂණලාභියා විවිධාකාරයෙන් තක්සේරුවට ලක් වෙයි. ප්‍රථම වසර දෙක අවසාන වන තෙක් ශික්ෂණලාභියා අභ්‍යන්තර ඇගයීමට ලක් වන අතර දෙවන වසර අවසානයේ දී බාහිර ඇගයීමට ලක් වේ. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශාස්ත්‍රීය කටයුතු සඳහා නායකත්වය ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබා දෙන අතර ඒ අනුව පාඨමාලාවට අදාළ විෂය නිර්දේශ සැකසීම, කථිකාචාර්යවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, අභ්‍යන්තර හා බාහිර ඇගයීම් කටයුතු සිදු කර අවසන් ප්‍රතිඵල සැකසීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් සිදු කෙරේ. 2017 වසරේ සිට නියාමක අදියරකින් ආරම්භ කළ දහතුන් 'වසරක සහතික කරන අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතියට හඳුන්වා දීමත් සමගම මෙම ශික්ෂණලාභීන්ගේ අධ්‍යයන විෂය පථය ද පුළුල් වී ඇති අතර, ඉදිරියේ දී ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවක් ලෙස උසස් කිරිමට අවශ්‍ය සැලසුම් ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කිරීම ආරම්භ කර ඇත.

විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් බඳවා ගැනීම, අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ගොඩනැගිලි ඉදි කිරිම, නඩත්තු කිරිම, පුස්තකාල සංවර්ධනය, අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෙන්ම ශික්ෂණලාභීන් සඳහා ගෙවීම් කිරීම ආදී මූල්‍ය හා පරිපාලන කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කෙරේ.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි තුන් අවුරුදු පාඨමාලාව සාර්ථකව අවසන් කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ජාතික අධ්‍යාපන ආයතනය මගින් ප්‍රදානය කරනු ලබයි. මෙම ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ලබන්නේ ක්‍රමවත් ඇගයීම් පටිපාටියක් මුල් කර ගත් ඇගයීම් ක්‍රියාවලියකට අනුගත කිරීමෙන් පසුවය.

# අධ්‍යාපන ප්‍රතිපත්ති හා ප්‍රතිඵල මූලික කළමනාකරණය පිළිබඳ

## 6 වන වැඩමුළුව

### වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග





අධ්‍යාපන සංවර්ධන සන්ධානය "අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහභාගීත්ව සැලසුම්කරණය සහ ප්‍රතිඵල පාදක කළමනාකරණය වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන හා සිවිල් සමාජ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම. (Awareness programme on enhancing participatory planning and result based management in the Education Sector- Promoting Civil society participation)" සම්බන්ධ වැඩමුළුවක් වයඹ පළාත් අධ්‍යාපන සැලසුම් නිලධාරීන් සඳහා 2026 මැයි මස 23 වන දින කුරුණෑගල දී පවත්වන ලදී. ඒ සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා සැලසුම් නිලධාරීන් ඇතුළු නිලධාරීන් 38 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වූ අතර ප්‍රධාන සම්පත් දායකත්වය සපයන ලද්දේ අධ්‍යාපන අමාත්‍යංශයේ හිටපු සැලසුම් අධ්‍යක්ෂක ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා හා වත්මන් සැලසුම් අධ්‍යක්ෂිකා නදීකා දසනායක මහත්මිය විසිනි. ඊට අමතරව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය නියෝජනය කරමින් සභාපති සචිත එන්. හේවගේ මහතා හා වයඹ පළාත් අධ්‍යක්ෂක මංගල ලාල් මහතා ඇතුළු වයඹ පළාත් සාමාජික සංවිධාන නියෝජිතයන් රැසක් මේ සඳහා සහභාගී විය. එසේම CED කාර්යය මණ්ඩලයත් මේ සඳහා සහභාගී විය.

**THE INTERNATIONAL DAY OF EDUCATION 2026**

සෑම වසරකම අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර දිනය යෙදෙන්නේ ජනවාරි 24 දිනයට යි. 2026 වසරේ UNESCO සංවිධානයෙහි මෙවර තේමාව වුයේ,

"The power of youth in co-creating education."

'අධ්‍යාපනය සම-නිර්මාණය කිරීමේදී තරුණයින්ගේ බලය.'

## මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන් පිටුවක්....

ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,

අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්තාවන් අපට කියන්න. මීලග හඩ සඟරාව සඳහා ඔබේ නිර්මාණ 2026 ජුලි 15 දිනට පෙර lakmalicedsrilanka@gmail.com මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12

ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12




**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

**නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය**

**web: cedsrilanka.org**

**දුරකතනය : 0112887642**